# වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය

## <u>පුස්තකාල සහායක</u> තනතුර සඳහා සුදුසුකම්ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම

**(I) අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් :**

**අධ්‍යාපනික :-** අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයයන් 02 ක් සමත් වී තිබීම.

**<u>සහ</u>**

**පළපුරුද්ද/කුසලතා :-**
අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබිය යුතු අතර විශේෂිත පරිමාණයක කාර්මික දක්ෂතා වෙළඳ පරීක්ෂණයකින් සනාථ කර තිබිය යුතුය.

**(II) පත්වීමේ ස්වභාවය :** ස්ථිර පත්වීමක් වන අතර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හිමිකම් පවතී.

**(III) වැටුප් පරිමාව :** U-PL 2 – 2025: 44,575-10*490-10*540-10*640-12*690-69,555p.m (කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2025/03/25 දිනැති අංක 06/2025 චක්‍රලේඛනයෙහි ප්‍රතිපාදනයන්ට අනුව වැටුප් ගෙවනු ලැබේ).

**(IV) තෝරාගැනීමේ ක්‍රමවේදය :** පත්කිරීම අදාල පත්වීම් අධිකාරිය විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත පරීක්ෂණයකින් සිදු කරන අතර මෙම පත්වීම සම්පූර්ණයෙන්ම ව්‍යුහගත පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු මත පදනම් වේ.

**(V) වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. ඉහල වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

❖ **අයදුම්පත් විශ්වවිද්‍යාල නිල වෙබ් අඩවිය (www.uovt.ac.lk) ඔස්සේ බාගත කරගත හැකිය.**

**අනෙකුත් කොන්දේසි :**

- මෙම පදවිය වෙනත් ස්ථානමාරු සඳහා යොදා ගත නොහැකිය.
- අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
- අධ්‍යාපනික හා වෘත්තිමය සුදුසුකම් ඇතුලත්ව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, දෙපාර්තමේන්තු/අංශ ප්‍රධානියාගේ නිර්දේශය අතුලත් ලිපියක් සහිතව සහතික කරන ලද සහතිකවල පිටපත් සමඟ 2025.10.10 දිනට හෝ ඊට පෙර උපකුලපති (වැඩ බලන), වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල පාර, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ උපකුලපති කාර්යාලය වෙත ගෙනවිත් භාරදීම සිදුකල යුතුය.
- සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තෝරා ගැනීමේ ක්‍රියාවලියට අනවශ්‍ය බලපෑමක් කිරීමට දරන ඕනෑම උත්සාහයක් අයදුම්කරු නුසුදුස්සකු වීමට හේතු වේ.
- බඳවා ගැනීමේ පටිපාටියට අනුව කෙටි ලැයිස්තුගත කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- සිංහල භාෂා දැන්වීමේ පවතින ඕනෑම ගැටලුකාරී/අපැහැදිලි අවස්ථාවකදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද ඉංග්‍රීසි භාෂාවෙන් පවතින බඳවා ගැනීමේ පටිපාටිය බලපැවැත්වේ.

වැඩ බලන උපකුලපතිතුමා
වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය
අංක 100, කඳවල
රත්මලාන
2025.09.26